ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1895/44 - 2015 ජනවාරි මස 02 වැනි සිකුරාදා - 2015.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජනාධිපතිවරණය - 2015.01.08

#### ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු ඡන්ද විමසීමට පැය 48කට පෙර අවසන් කිරීම

2015 ජනවාරි 08 වැනි දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සම්බන්ධව සියලුම ප්‍රචාරක කටයුතු 2015.01.05 දින මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් වීමට නියමිතය. ඡන්ද විමසීම්වල දී නිහඬ කාලසීමාව ලෙස හැඳින්වෙන එතැන් සිට ඡන්ද විමසීම පවත්වා අවසන් වීම දක්වා වූ මෙම කාල සීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් කිසිදු අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන හෝ අගතියට පත් වන ආකාරයේ කිසිදු හෝ ප්‍රචාරණයක් සිදු කළ නොහැකිය. එහෙත් 2015.01.05 දින ජනාධිපතිධුර අපේක්ෂක අවසන් ප්‍රචාරක රැළි පැවැත්වෙන හෙයින් ඒවායේ තොරතුරු පමණක් 2015.01.06 දින ප්‍රසිද්ධ කිරීමට/ප්‍රචාරය කිරීමට ඉඩදිය හැකිය. එදින වෙනත් පක්ෂ/අපේක්ෂක ප්‍රචාරක වෙළෙඳ දැන්වීම්, දේශපාලනමය වැදගත්කමක් ඇති වාර්තා/ලිපි/වැඩසටහන් යනාදිය පළකිරීම හෝ ප්‍රචාරය කිරීමෙන් වැළකී සිටිය යුත්තේය.

විද්‍යුත් මාධ්‍ය හරහා 2015.01.06 සහ 07 යන දෙදින තුළ දී හා 2015.01.08 දින පැය 1800 දක්වා කාලය තුළ දී පසුගිය කාලය තුළ සිදුවූ සංවර්ධන කටයුතුවලට අදාළ වැඩසටහන්, ඉදිරි සංවර්ධන සැලසුම් පිළිබඳ වැඩසටහන්, අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩසටහන්, යුද ජයග්‍රහණය පිළිබඳ වැඩසටහන් යනාදිය නව විකාශන හෝ නැවත විකාශය කිරීම් හරහා පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම සහ තරග කරන අපේක්ෂකයන් සහභාගි වූ ආගමික උත්සව ඇතුළු විවිධ උත්සව හෝ නැවත විකාශ ලෙස ප්‍රචාරය හරහා පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම හෝ වෙනත් අපේක්ෂකයකු අගතියට පත් කිරීම සිදුවන ආකාරයේ කිසිදු වැඩසටහනක් ප්‍රසිද්ධ කිරීමෙන්/ප්‍රචාරය කිරීමෙන් වැළකී සිටිය යුත්තේය. එහෙන්ම මුද්‍රිත මාධ්‍යවල ද මෙවැනි අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම හෝ අගතියට පත්කිරීමට අදාළ කරුණු, පෙර සඳහන් නිහඬ කාලසීමාව තුළ පළ නොකළ යුතු/ප්‍රසිද්ධ නොකළ යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015 ජනවාරි මස 02 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ දී ය.

01 - 556


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*